# නවෝදය நவோதயம் Codesep




## වතු සමාජ සංවර්ධන සේවාව
ගාලු රදගුරු වසම

## தோட்ட சமூக அபிவிருத்தி சேவை
காலி மறை மாவட்டம்

## Community Development Service for Plantations
Diocese of Galle

# ' නවෝදය ව්‍යාපෘතිය '

*'' මිනිසාගේ උදාරත්වය දෙවිඳුන්ගේ මහිමය වේ ''*

## <u>හැඳින්වීම</u>

**'නවෝදය'** වනාහි දකුණු පළාතේ ජීවත්වන වතු ප්‍රජාව වෙනුවෙන් සමාජීය හා ආර්ථික දියුණුව සඳහා දකුණු පළාතේ කතෝලික සභාව විසින් දෙනියාය කතෝලික දේවස්ථාන භූමියේ පිහිටි මධ්‍යස්ථානය තුළින් ක්‍රියාවට නංවනු ලබණ වැඩපිළිවෙලකි.

ගාලු දිස්ත්‍රික්කයේ ඇල්පිටිය උඩුගම හා බද්දේගම නගරාශ්‍රිත වතුවල ද මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස පිටබැද්දර හා දෙනියාය යන නගරාශ්‍රිත වතු ද මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සඳහා තෝරාගෙන ඇත.

## <u>දර්ශනය</u>

*ප්‍රේමය, සාධාරණත්වය, හා සාමය යන සුවිශේෂී වටිනාකම් මත පිහිටා, සියලු ජාතින් හා ආගම් නියෝජනය කරන දකුණු පළාතේ වතු ප්‍රජාවගේ මානව උදාරත්වය සදහා අධ්‍යාපන, සමාජීය, ආර්ථික, සංස්කෘතික හා ආගමික සංවර්ධනය.*

## <u>මෙහෙවර</u>

*(අ) සමාජයේ නොදියුණු හා අවාසනාවන්ත තත්ත්වයේ සිටින මෙම වතු ප්‍රජාවේ සෑම පුද්ගලයෙකුටම, මිනිස් වටිනාකම් හා ගෞරවය ලබා ගැනීම සඳහා ක්‍රියාකිරීම.*

*(ආ) දකුණු පළාතේ වතු ප්‍රජාව හා අසල්වැසි ජනයන් අතර සමගිය හා සහ ජීවනය සදහා අතහිත දීම.*

## <u>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම තුලින් ලැබෙන ප්‍රතිලාභ.</u>

(01) වතු ජනතාව දැනුවත් කිරිම තුලින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරිම.
(02) දැනුවත් හා දියුණු වතු ජනතාවක් බිහිවීම තුලින් වැවිලි ක්ෂේත්‍රයේ දියුණුවක් ඇති කිරිම.
(03) දියුණු වතු ප්‍රජාවක් බිහිකිරිම තුලින් සමස්ත රටේ දියුණුවට දායක විම.

## ක්‍රියාකාරකම්

**(අ) වතු බැහැදැක දත්ත රැස්කිරීම සහ කණ්ඩායම් පිහිටුවීම.**

- වයාපෘතියේ පූර්ණ කාලීන සේවය සඳහා දකුණු පළාතේ වතුකරයේ ජීවත්වන අයගෙන් සජීව සජීවිකාවන් 15 දෙනෙක් තෝරාගෙන ඔවුනට පුහුණුවීම් ලබාදීම.
- තෝරාගත් වතුවල භූගෝලීය වටපිටාව අනුව ජීවත්වන පවුල් 40 සිට 50 දක්වා පවුල් එකතුකර කණ්ඩායම් පිහිටුවීම.
- එම බිහිවූ කණ්ඩායම් වල ඉහත සඳහන් ක්ෂේත්‍ර ගැන ඔවුන්ව දැණුවත් කර ඔවුන් සමාජයේ ක්‍රියාශීලී පුද්ගලයින් බවට පත්කිරීම.

**(ආ) වැඩිහිටි අය වෙනුවෙන්**

- එම කණ්ඩායම් තුල ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම.
- නායකත්වය පිළිබඳ වැඩමුළු පැවැත්වීම.
- වැඩිහිටි අය වෙනුවෙන් සවස් කාලයේදී සාක්ෂරතා පන්ති පැවැත්වීම.

**(ඇ) පාසල් අධ්‍යාපනය වෙනුවෙන්**

- දකුණු පළාතේ උග්‍ර ගුරු හිඟයක් පවතින වතු පාසල් 10ක් සඳහා ස්වේච්ඡා ගුරුවරුන් පත්කර සහාය දීම සහ ඔවුන්ව මාසිකව පුහුණු කිරීම.
- මෙම වතු පාසල් දහයෙන් 11 වසරේ දක්ෂ දරුවන් දස දෙනෙකුට සාමාන්‍ය පෙළ විභාගය දක්වාද උසස්පෙළ දක්ෂ දරුවන් 06 දෙනෙකුට උසස් පෙළ විභාගය දක්වාද අධ්‍යාපනය වෙනුවෙන් සහාය දීම.

**(ඈ) තරුණ තරුණියන් සඳහා**

- තරුණ තරුණියන් සඳහා වෘත්තිය පුහුණුව ලබා දීමට අතහිත දීම.
- වතු සමාජයේ තරුණයන් අතර විවිධ විශමතා වලට නැඹුරු නොවී ආරක්ෂා කිරීමට ක්‍රීඩාවට යොමු කරනුවස් 'නවෝදය' ක්‍රියාකාරකම් තිබෙන වතු ආශ්‍රිත කණ්ඩායම් අතර 'නවෝදය කුසලාන' ක්‍රිකට් තරගාවලියක් පැවැත්වීම සහ ජයග්‍රාහී කණ්ඩායම ජාතින් අතර සමගිය ඇතිකිරීමේ අරමුණින් නගරබද ක්‍රිකට් කණ්ඩායමක් සමග විශේෂ තරගයකටද සහභාගිකරවීම.

**(ඉ) සමාජ සහ සංස්කෘතික**

- නාට්‍ය හා කලා අංශයෙන් දකුණු පළාතේ වතුවලින් තරුණ තරුණියන් තෝරාගෙන 'නවෝදය කලා සංගමය' පිහිටුවීම.
- ආගම් අතර සහ ජාතින් අතර සමගිය වර්ධනය කිරීම සඳහා ආගම් සහ සමාජීය පොදු උත්සවයන් වෙනුවෙන් උත්සවමාලා සංවිධානය කිරීම.

**(ඊ) සෞඛ්‍ය**

- වතුකරයේ තරුණියන් අතර සෞඛ්‍ය පිළිබද දැනුම වර්ධනය කිරීම.
- සෑම වත්තකම තරුණියන් දෙදෙනෙකු බැගින් තෝරාගෙන ඔවුනට සෞඛ්‍ය සම්බන්ධ දැණුවත් කිරීම. (*දරුවන්ගේ එන්නත් පිරිසිදුකම විවිධ ලෙඩ රෝග යනාදිය පිළිබදව* )

## අවසානය

ඉහත සඳහන් ක්‍රියාකාරකම් තුළින් නවොදය ව්‍යාපෘතිය දකුණු පළාතේ වතු ප්‍රජාවට ජාති ආගම් භෙද වලින් තොර යහපත් සමාජයක් බිහිකරන්නට අත්වැලක් වන බව අපි විශ්වාස කරමු.

**මේ ප්‍රජාව නගාසිටුවීම වෙනුවෙන් ඔබගේ යෝජනා සහ සහයෝගය අපි අපේක්ෂා කරමු.**

***මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට අපට අතහිත දෙන***

- දකුණු පළාතේ කතෝලික සභාවේ අති උතුම් රාජගුරුප්‍රසාදීන් වහන්සේටද
- මුදල් ආධාර සම්පාදනය කරන විදේශීය ආයතනවලටද,
- වතු සමාගම් ප්‍රධානීන්, වතු අධිකාරීවරුන් හා සහකාර අධිකාරීවරුන්ටද
- දිස්ත්‍රික් ලේකම්තුමන්, ප්‍රාදේශීය ලේකම්තුමන් ඇතුලු ග්‍රාම නිළධාරීන්ටද
- අධ්‍යාපන, පොලිසිය, හා සෞඛ්‍ය සහ අනෙකුත් රාජ්‍ය දෙපාර්තමේන්තු නිලධාරීන්ටද
- අපට අතහිත දෙන සෑම සියලු දෙනාටද

***අපගේ ස්තූතිය පුදකර සිටිමු.***

මෙම ව්‍යාපෘතිය පිළිබඳව වැඩි විස්තර පහත සඳහන් ලිපිනයෙන් විමසන්න.

**ස්තුතියි දෙවිපිහිටයි**

**අධ්‍යක්ෂක පියතුමා / සම්බන්ධිකාරක**
**'නවෝදය' ව්‍යාපෘතිය,**
**ශා. ජෝසප් දෙවස්ථානය,**
**දෙනියාය.**
041-227-3216